# An Introduction to the Four Buddhist Traditions

## චතුර්විධ බෞද්ධ සම්ප්‍රදායයන් පිළිබඳ හැඳින්වීමක්

Karapikkada Sobitha

කරපික්කඩ සෝභිත හිමි

### ප්‍රවේශය

සම්බුද්ධ පරිනිර්වාණයත් සමඟ සසුන තුළ විවිධ අර්බුද පහළ වූ බව ශාසන ඉතිහාසය තුළින් පැහැදිලි වේ. බුදුන් පිරිනිවීමෙන් ශතවර්ෂයක් ගත වන තුරු බෞද්ධ භික්ෂූන්ගේ නිකාය වශයෙන් බෙදී යාමක් නොවී ය. ඒ කාලය තුළ බෞද්ධ සංඝයා පෙනී සිටියේ "ශාක්‍ය පුත්‍රීය" භික්ෂූන් වශයෙනි. විධිමත් ලෙස බෞද්ධ නිකායයන්ගේ ජනිත වීම පිළිබඳ කතා ප්‍රවෘත්තිය අතිශය සංකීර්ණ වූවකි. මේ පිළිබඳ තොරතුරු ගවේෂණයේ දී ථෙරවාදීන් විසින් රචිත කථාවත්ථුප්පකරණය, දීපවංස, මහාවංස වැනි පාලි මූලාශ්‍ර පමණක් ප්‍රාමාණික නොවේ. ටිබෙට් චීන වැනි භාෂාවලින් දැනට පවතින,

- භව්‍යයන්ගේ නිකාය භේද විභංග ව්‍යාඛ්‍යාන,
- විනීතදේවයන්ගේ සමයභේදෝපරචණචක්‍රෙනිකායභේදෝපදේශන සංග්‍රහ,
- වසුමිත්‍රයන්ගේ, සමයභේදෝපරචණ චක්‍ර,[1]

නම් කෘතීන් වැදගත් වේ. බුද්ධ පරිනිර්වාණයෙන් සිය වසරක් ඇවෑමෙන් දෙවැනි ධර්ම සංගායනාව පැවැත්විණි, කාලාශෝක, ධර්මාශෝක යන දෙ රජුන් අතර ඇති වූ සියවසක් අතර කාලයේ අටළොසකට බෙදී ගිය නිකායයන්ගේ නාමාවලිය දක්වන නිකාය සංග්‍රහය ඇතුළු මූලාශ්‍රවල "**සබ්බත්ථිවාද** (සර්වාස්තිවාදය) හා **සුත්තන්තික** (සූත්‍රවාදි-සෞත්‍රාන්තික)" යන දෙ නිකාය ඊට ඇතුළත් වේ. හීනයාන සම්ප්‍රදායට ඇතුළත් මෙකී නිකායයන් විසින් බෞද්ධ චින්තනයේ සංවර්ධනය විෂයයෙහි කර ඇති බලපෑම සෙසු නිකායයන්ට වඩා ප්‍රබල වූ බව පෙනේ. කණිෂ්ක රාජසමයේ කාශ්මීරයේ කුණ්ඩල වන විහාරයේ දී පැවැත්වූ සිව්වන ධර්ම සංගීතියෙන් පසු දර්ශනාත්මක විෂයයන් මූලික කොටගෙන චතුර්විධ බෞද්ධ සම්ප්‍රදායක් ප්‍රභවය විය.[2] එනම්,

i. වෛභාෂික (සර්වාස්තිවාද)
ii. යෝගාචාර
iii. සෞත්‍රාන්තික
iv. මාධ්‍යමක

## සර්වාස්තිවාදි සම්ප්‍රදාය

නිකායාන්තර බුදුසමය තුළ ඉතා වැදගත් වූ දාර්ශනික බෞද්ධ සම්ප්‍රදායක් ලෙස සර්වාස්තිවාදය දැක්වේ. සත්වාදී ආකල්පයක් ඍජුව දරන්නා වූ මෙහි මූලික ඉගැන්වීම වූයේ ත්‍රෛකාලීන ධර්ම අස්තීත්‍වය යි.[3] මෙය මූලික සූත්‍රාගත දේශනාවන්ට ප්‍රතිවිරුද්ධ වූවකි. අනිත්‍යතා සිද්ධාන්තය පදනම් වූ මුල් බුදුසමය සියලු ධර්මයන්ගේ අනිත්‍යතාව නිරන්තරයෙන් අවධාරණය කොට ඇත. මෙයට පිළිතුරක් ලෙස සර්වාස්ථිවාදීහු ධර්මයන්හි පැවැත්ම පිළිබඳ ප්‍රධාන ලක්ෂණ දෙකක් පෙන්වා දෙති.[4]

01. ස්වභාව ලක්ෂණය
02. සාමාන්‍ය ලක්ෂණය

ස්වභාව ලක්ෂණය යනු ධර්මයන්ගේ නොවෙනස්වන්නා වූ පදාර්ථය යි. මෙය අතීත, වර්තමාන, අනාගත යන කාලත්‍රයෙහි ම වෙනසකට භාජනය නොවේ. මෙම මතය තහවුරු කිරීම සඳහා සර්වාස්තිවාදීහු ධර්ම විෂයෙහි සාශ්‍රව සහ අනාශ්‍රව යනුවෙන් අවස්ථා දෙකක් දක්වයි. සාශ්‍රව යනු සංස්කෘත ධර්ම යි. අනාශ්‍රව යනු අසංස්කෘත ධර්ම යි. සංස්කෘත යන්නෙන් හේතු ප්‍රත්‍යව හටගන්නා වූ සියල්ල අර්ථවත් වන අතර මෙයින් අතීත කාලික ධර්ම අස්තීත්‍වයක් හඟවයි. ''කෘත'' යනු අතීත කාලික කෘදන්ත පදයකි. නමුත් මෙය තුළින් වර්තමාන, අනාගත කාලික ධර්ම අස්තීත්‍වයක් ද හැඟවේ. ''දුග්ධ'' යනු දොවන ලද කිරි හෙවත් කිරි යන්නට අපර නාමයකි. මෙයින් අතීත කාලික අදහසක් අර්ථවත් වුව ද, දෙවීමට පෙර පයෝධර වූවේ ද, දෙවූ අවස්ථාවේ දී කිරි වූවේ ද, දෙවූ පසු කිරි වූවේ ද එක ම පදාර්ථය යි. මෙම තර්කානුකූල පදනම මත ත්‍රෛකාලීන ධර්ම අස්තීත්‍වය පෙන්වා දෙන සර්වාස්තිවාදීහු ස්වමතය තහවුරු කිරීම උදෙසා භාවාන්‍යතාවාද, අවස්ථාන්‍යතාවාද, ලක්‍ෂණාන්‍යතාවාද, අන්‍යථාන්‍යතාවාද යනුවෙන් මතවාද සතරක් දක්වා ඇත.

### භාවාන්‍යථාත්මවාදය

භදන්ත ධර්මත්‍රාත ඉදිරිපත් කරන මෙම මතවාදයට අනුව අතීත, වර්තමාන සහ අනාගතයෙහි භාවයන්ගේ විෂමත්වයක් පවතියි. යම් විටක අනාගත වස්තූන් සිය අනාගත භාවය හැර වර්තමානයේ පවතියි ද එවිට එය වර්තමාන භාවය පිළිගනු ලබයි. මෙම ද්‍රව්‍යයේ කිසිම ආකාරයක පරිවර්තනයක් නොවන අතර එය එසේම පවතී. උදාහරණයක් වශයෙන් යම්විටක කිරි, දී කිරි බවට පත්වෙයි ද එවිට එහි ස්‍වභාවයේ වෙනස් වීමකි. රසාදී භාවයන් නොයෙක් ආකාර වේ. එහෙත් “කිරි” නැමැති පදාර්ථයෙහි කිසිම ආකාරයක පරිවර්තනයක් සිදු නොවේ.

### ලක්‍ෂණාන්‍යථාත්මවාදය

භදන්ත ඝෝෂගේ මතය නම් අතීත වස්තු අතීත ලක්‍ෂණයන්ගෙන් යුක්තව පවතින බවයි. එහෙත් වර්තමාන හා අනාගත ලක්‍ෂණවල අත්හැරීමක් කිසිවිටෙක නොකරයි. මේ අනුව වර්තමාන පදාර්ථයන් වර්තමාන ලක්‍ෂණයෙන් යුක්ත වුවද, අතීත සහ අනාගත ලක්‍ෂණවලින් විරහිත නොවේ. යම් අයුරකින්

එක් සුන්දරියක් කෙරෙහි අනුරාගී කාමි පුරුෂයෙකු වෙනත් සුන්දරියක් කෙරෙහි අනුරාගයෙන් තොර නොවන්නාක් මෙන් ඉදින් ඔහු එකම කාමිනියකට ප්‍රේම කලත් වෙනත් ස්ත්‍රීන් කෙරේ ප්‍රේම කිරීමේ අදහස ඔහු අත් නොහර සිටී.

**අවස්ථාන්‍යථාත්මවාදය**

හදන්ත වසුමිත්‍රගේ අදහස වන්නේ කාලත්‍රයේ වෙනස්කම අවස්ථා පරිවර්තනයෙන්ම සිදු වන්නේය. මෙහි අවස්ථාව යනුවෙන් අදහස් කරන්නේ කර්මයන් පිළිබඳව ය. ඉදින් කිසියම් වස්තුවක් කර්මයෙන් උපන්නේ නම් එය අතීත වන්නේ ය. ඉදින් කර්මයක් ආරම්භ කොට ඇති නම් එය වර්තමානය යි. ඉදින් මෙතෙක් කර්මයන් ආරම්භ කොට නොමැති නම් එය අනාගතය යි. ඒ නිසා ධර්මයන්හි අවස්ථානුකූලව වෙනස්කම් ඇති වන අතර ද්‍රව්‍යයන්ගෙන් සිදු නොවේ.

**අන්‍යථාන්‍යථාවාදය**

හදන්ත බුද්ධ දේවයන්ගේ අන්‍යථාන්‍යථාවාදයට අනුව නොයෙක් වර්ණයන්ගේ අනුකූලත්වයට අනුව ධර්මයන් පිළිබඳව කාලය ගැන කල්පනාව ඇති විය. වර්තමානය හා අනාගතයට වඩා යම්කිසි වස්තුවක සංඥාව අතීත වන්නේ ය. අතීත සහ වර්තමානයට වඩා වස්තූන් අනාගත යැයි කියනු ලැබේ. යම් සේ එකම ස්ත්‍රිය දියණියක්, බිරියක් හා මවක් යන සංඥාව ලබයි. පියා හා සැසඳීමේ දී ඇය දියණියකි. ස්වාමියා හා සැසඳීමේ දී ඇය බිරියකි. මෙහි වස්තු වශයෙන් එකක් මැයි එහෙත් අපේක්ෂා කරන අදහස අනුව එහි වෙනස්කම් ඇත.

සර්වාස්තිවාදීහු ධර්ම පිළිබඳ සාමාන්‍ය ලක්ෂණයක් ද පෙන්වා දෙති. මෙයට අනුව සියලු ධර්ම අවස්ථා 04 ක් නියෝජනය කරනු ලබයි.

01. ජාති - හටගැනීම
02. ස්ථිති - පැවැත්ම
03. ජරා - විනාශමුඛ වීම
04. වය - විනාශය

මේ විග්‍රහයට අනුව ධර්මයක හටගැනීමක් ද, එහි පැවැත්මක් ද, විනාශයට යොමුවන අවස්ථාවක් ද, විනාශය ද දක්වේ. මෙහි දී මුල් බුදුසමයේ දක්වූ **''ඨිතස්ස අඤ්ඤථත්තං''** සහ ථෙරවාදී ඨිතික්ඛණ, අවස්ථාව ද සර්වසතිවාදීහු ස්ථිති, ජරා වශයෙන් අවස්ථා දෙකක් තුළ පෙන්වා දී ඇත. මෙහි ඇති ''ස්ථිති'' අවස්ථාව මඟින් ධර්මයේ ඍජු පැවැත්මක් අර්ථවත් වන අතර එම අවස්ථාව තුළ පුද්ගලයා

ධර්මයන් පිළිබඳ ප්‍රත්‍යක්‍ෂය නිර්මාණය කරගන්නා බව සර්වාස්තිවාදීහු දක්වති. මෙය **''බාහ්‍යාර්ථප්‍රත්‍යක්‍ෂවාදය''** නම් වේ.

## සෞත්‍රාන්තික සම්ප්‍රදාය

මූලික සූත්‍ර දේශනා ප්‍රාමාණිකත්‍වයෙන් ගෙන කරුණු දක්වූවෝ සෞත්‍රාන්තිකයෝ වූහ.[5] ඔවුහු ධර්ම විෂයෙහි අවස්ථා දෙකක් පමණක් දක්වති. එනම්,

01. උප්පාද - ඉපදීම
02. වය - විනාශය

මෙය ඉගැන්වීම විෂයෙහි ඔවුහු මූලික සූත්‍රාගත මූල බීජ ඉදිරිපත් කොට ඇත.[6] මෙසේ ධර්මයන්ගේ ඉපදීම සහ විනාශය පමණක් පෙන්වා දෙන සෞත්‍රාන්තික සම්ප්‍රදාය සියලු ධර්ම ක්‍ෂණයක් තුළ ඉපදී එම ක්‍ෂණය තුළ ම විනාශ වී යන බව දක්වමින් ක්‍ෂණවාදයක් නිර්මාණය කළේ ය.[7] මෙම ක්‍ෂණවාදයට අනුව සියලු ධර්ම ක්‍ෂණයක් තුළ ඉපිද නිරෝධයට පත් වේ නම් එම ධර්මයන් පිළිබඳ ප්‍රත්‍යක්‍ෂය කෙසේ ලබන්නේදැයි යන ගැටළුවට සෞත්‍රාන්තික පිළිතුර වූයේ සියලු ධර්ම අනුමානය තුළින් ප්‍රත්‍යක්‍ෂ කරගන්නා බව යි. ඉන්ද්‍රිය ද සිත ද ක්‍ෂණික වන බැවින් සිත දැනීම ලබන ක්‍ෂණය වන විට ඉන්ද්‍රිය තුළින් ලබන්නා වූ අරමුණ නැතිවී ගොස් ය. එබැවින් කිසිදින කිසිවෙකුට බාහිර ලොව ප්‍රත්‍යක්‍ෂ කරගත නොහැකි ය. ප්‍රත්‍යක්‍ෂක් නොමැත. ඇත්තේ අනුමානයක් පමණි. මෙය සෞත්‍රාන්තිකයෝ ''බාහ්‍යාර්ථඅනුමේයවාදය'' ලෙස දැක්වූහ. මෙම ඉගැන්වීම මානසික ක්‍රියාවලියකි. පුද්ගලයා ඉන්ද්‍රිය මඟින් අරමුණු පිළිබඳ සංඥාව ලබා ගනී. විෂය වන්නේ සංඥාව පමණකි. මෙහි දී අරමුණු අතීතයට ගොස් හමාර ය. එබැවින් විෂය වූ සංඥාව මඟින් අරමුණු අනුමාන කරනු ලබයි.

සෞත්‍රාන්තික නිකාය බාහිර විෂය වස්තු ප්‍රත්‍යක්‍ෂය පිළිබඳ අනුමේයවාදයක් ඉදිරිපත් කළ ද එය, සර්වාස්තිවාදය මෙන් ම සත්වාදී ස්ථාවරයක පිහිටා ඇත. ස්වලක්‍ෂණමය වූ ධර්මස්වභාවය වාස්තවික සත්‍යයක් ලෙස ඔවුන් ද පිළිගෙන ඇත. එහි ප්‍රත්‍යක්‍ෂය පමණක් අනුමානය මඟින් සිදු කෙරේ.

## මාධ්‍යමක සම්ප්‍රදාය

මහායාන දර්ශනයේ ප්‍රාරම්භක නිකාය ලෙසට මාධ්‍යමික සම්ප්‍රදාය හැඳින්විය හැකිය. මෙම සම්ප්‍රදාය බිහිවීම සඳහා මහාසාංඝික නිකායේ ඉගැන්වීම් මූලික වූ බව කිව හැකිය. එහෙත් මහායාන දර්ශනයක් ලෙසට ක්‍රි.පූ. පළමුවන සියවස වනවිට ඉදිරිපත් කිරීමේ ගෞරවය හිමිවන්නේ නාගර්ජුන පාදයන්ට ය. එතුමා එකල පැවති ආත්මවාදය ඛණ්ඩනය කිරීමට බෞද්ධ අනාත්ම දර්ශනය දෙසට නොහැරී සාපේක්ෂක වාදය ඉගැන්වෙන ප්‍රතීත්‍ය සමුප්පාදය පදනම් කර ගත්හ. [8]එබැවින් බෞද්ධ දර්ශන සම්ප්‍රදායන් අතර මාධ්‍යමික දර්ශනය නමින් දැක්වෙන්නේ ප්‍රතීත්‍ය සමුප්පාදය පදනම් කර ගත් සාපේක්ෂක වාදයයි.

මාධ්‍යමික දර්ශනය පිළිබඳ සිද්ධාන්ත බුද්ධකාලයටත් පෙර සිට පැවතෙන්නේ යැයි විචාරක මතය වුවද නාගර්ජුන පාදයන් මාධ්‍යමික දර්ශනය ගොඩනගන්නේ බුද්ධ දේශිත ප්‍රතීත්‍ය සමුප්පාදයෙනි. මේ අනුව සත්වයාගේ හා ලෝකයේ ස්වභාවය විවරණය කිරීමේ දී ස්ථවිරවාදීන්ගේ සහ ආභිධර්මිකයන්ගේ විවරණය අනුව බලන විට පැරණි බුදු සමය පුද්ගල නෛරාත්ම්‍ය වාදයක් හා ධර්ම අනිත්‍යත්ව වාදයක් ලෙෂ සංක්ෂිප්තව දැක්විය හැකිය. එහෙත් මේ අයුරින් ධර්ම විවරණය කිරීමේ දී බුද්ධ මතය ඉදිරිපත් නොවන බව සැලකූ මාධ්‍යමිකයන් ශූන්‍ය යන වචනයට අවධානය යොමු කරමින් සත් අසත් යන ශාස්වත උච්ඡේද විසින් ඇති අන්තවලට නොවැටී බුද්ධ වචනය ව්‍යාඛ්‍යා කරන්නට විය.[9] මෙසේ අන්තවලට නොවැටී මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කරන හෙයින් ද ඔවුහු මධ්‍යමිකයන් ලෙස හඳුන්වනු ලැබේ.[10] ඔවුහු නිරන්තරයෙන් සත්වයාගේ හා ලොකයේ ස්වභාවය හේතුඵල සම්බන්ධය, සංසාරය, දුක ආදී නිවනින් මෙපිට ඇති කවර කරුණක් වුවද ඔවුහු පටිච්ච සමුප්පාදයට අනුගතවම විග්‍රහ කරති.[11]

ශූන්‍යතාව, මධ්‍යම ප්‍රතිපදාව, සාපේක්ෂතා සංකල්ප බිහිකර ගැනීමේ ලා පටිච්චසමුප්පාද න්‍යාය භාවිත කර ඇත.[12] යමක් පටිච්චසමුප්පාද වේ නම් එය ශූන්‍යතාව යැයි කියමු. ඒ ශූන්‍යතා ප්‍රඥප්තිය නිසා මොවුහු මාධ්‍යමික ලෙස හැඳින්වේ.[13] ඔවුනට අනුව ලෝකයේ ඉහත සංකල්පවලට යටත් නොවූ කිසිවක් නොමැති බව මාධ්‍යමික දර්ශනයයි. අහේතුක වූ අප්‍රත්‍යය වූ කිසිවක් ලෝකයේ කිසිම තැනක නොමැති බව ඔවුන්ගේ මතයයි.[14]

## යෝගාචාර සම්ප්‍රදාය

ජීවය, විශ්වය, බෝධිපාක්ෂික ධර්ම, කාම රූප අරූප යන ත්‍රෛධාතුකය ආදී සියල්ල විඥානය හෙවත් සිත තුළ ම නිර්මාණය වූ සිත ම පදනම් කොට ගත්තා වූ විඥප්තිමාත්‍රයක් බව දක්වන්නහු යෝගාචාර විඥානවාදීන් ලෙස පිළිගැනේ. ඔවුන්ගේ ඉගැන්වීම්වල මූල බීජය වී ඇත්තේ විඥානය යි. විඥානය හැර අන් කිසිවක් සත්‍ය වශයෙන් නොපවත්නා බව ද, මුළු විශ්වය ම බුද්ධිමය බව ද ඔවුහු දක්වති. **''සර්වං බුද්ධිමයං ජගත්''** එසේ ම විඥානය බාහිර විෂයයන් කෙරෙහි රඳා නොපවතින බවත්, එය ස්වයං උපස්ථිතියෙන් යුක්ත වන බවත්, යෝගාචාර මතය යි. එම නිසා යෝගාචාර දර්ශනය ''නිරාලම්බනවාදය'' ලෙස ද හැඳින්වේ.

''යෝගාචාර '' යනුවෙන් දක්වෙන්නේ මෙම නිකායෙහි ප්‍රායෝගික පැතිකඩ යි. සත්‍යාවබෝධය පිණිස යෝගයත්, ආචාරයත් එක සේ අවශ්‍ය බව මෙයින් අදහස් වෙයි. මෙහි ''යෝගය'' නම් යෝනිසෝ මනසිකාරය යි. සිහි නුවණින් යෙදී සියුම් ලෙස ගැඹුරට කල්පනා කිරීම යි. සත්‍යාසත්‍යතාවය මෙනෙහි කිරීම යි. තර්ක බුද්ධිය යොදමින් යම් කරුණක් පිළිබඳව විමති උපදවා විමර්ශනය කිරීම යි. ''ආචාරය'' යනු පරතෝඝෝෂය යි. එනම් ගුරුන්ගෙන් අසා දැන ගැනීම යි. එසේ ගුරුන්ගෙන් අසා දැනගත් යහපත් වූ උපදෙස් නොවෙනස්ව එලෙස ම ආරක්ෂා කොටගෙන ක්‍රියා කිරීම යි. මෙසේ විමංසන බුද්ධිය හෙවත් ''යෝගයත්'' ගුරු උපදේශය හෙවත් ''ආචාරයත්'' පිළිගත්තහු යෝගාචාරීහු නම් වෙති.

මහායාන බෞද්ධ දාර්ශනික චින්තනයේ ප්‍රතිඵලයක් ලෙස ක්‍රි.ව. 4 වන සියවස තුළ යෝගාචාර විඥානවාදී දර්ශනය බිහි වී ඇත. ආචාර්ය අසංගපාදයන්ගේ දොළොස් වසරක යෝගාභ්‍යාසානුභූතියෙහි දාර්ශනික ප්‍රතිඵලයක් වූ මෙම විඥානවාදය ආචාර්ය වසුබන්ධු පාදයන්ගේ අතින් පෝෂණය වූවකි. ඇතැම් මූලාශ්‍රය සාධකයන්ට අනුව ආචාර්ය මෛත්‍රීනාථ පාදයන් මෙම සම්ප්‍රදායෙහි ආදී කර්තෘවරයා ලෙස සැලකේ. අසංග, වසුබන්ධු ආචාර්යවරුන්ගෙන් අනතුරුව ධර්මකීර්ති, දිංනාග ආචාර්යවරු මෙම දර්ශනය තවදුරටත් සංවර්ධනය කළ අතර පසු කාලීනව දිංනාග ශිෂ්‍ය වූ ශංකර ස්වාමි (ක්‍රි.ව. 500), ආචාර්ය ධර්මපාල (ක්‍රි.ව. 600), ආචාර්ය ශාලිභද්‍ර (ක්‍රි.ව. 635), ආචාර්ය දේවේන්ද්‍රබෝධි (ක්‍රි.ව. 650), ආචාර්ය ශාන්තරක්ෂිත (ක්‍රි.ව. 749), ආචාර්ය කමලශීල (ක්‍රි.ව 750 ), ආචාර්ය කල්‍යාණරක්ෂි (ක්‍රි.ව. 829) ආචාර්ය ධර්මෝත්තර (ක්‍රි.ව. 889) යන ආචාර්යවරු විඥානවාදය විෂයෙහි නව අදහස් ඉදිරිපත් කරමින් තවදුරටත් මෙම දර්ශනය පෝෂණය කොට ඇත.

යෝගාචාර විඥානවාදී දර්ශනයේ මූලික සිද්ධාන්තය විඥප්තිමාත්‍රතාව යි. විඥප්තිමාත්‍රතාව යනු ''පරමාර්ථ වශයෙන් ලොව ඇත්තේ විඥානය පමණකි. බාහිර ලෝකයේ ඇති සියල්ල ඒ විඥානය විසින් ඇති කරනු ලබන විඥප්තිමාත්‍රයක් හෙවත් සිතින් මවා ගැනීමකි. වැටහීම් මාත්‍රයකි. චිත්ත නිර්මිත භ්‍රාන්තියකි. එය වූ කලී ඉන්ද්‍රිය ගෝචර වනු විනා සත්‍ය වශයෙන් සත්භූත වූවක් නොවේ'' වශයෙන් විග්‍රහ වේ. බාහිර ලෝකය පිළිබඳ සත්වාදී ආකල්පයක් දරන්නා වූ ථෙරවාද, සර්වාස්තිවාද නිකායයන් ධර්මයන්ගේ පැවැත්ම විෂයෙහි ''ඨිති'' ''ස්ථිති'' අවස්ථාවන් අර්ථවත් කරමින් ''බාහ්‍යාර්ථප්‍රත්‍යක්ෂවාදය'' ඉදිරිපත් කළහ. සෞත්‍රාන්තික නිකාය බාහිර ලෝකය විෂයෙහි දරූ ආකල්පය ''බාහ්‍යාර්ථඅනුමෙයවාදය'' යි. එනම්, විෂය වස්තු ප්‍රත්‍යක්ෂය, විඥානය මූලික කොටගෙන අනුමාන වශයෙන් ගතයුතු බව යි. මෙම ආකල්පය විෂයෙහි මාධ්‍යමික අදහස ''ශූන්‍යතාවය'' යි. එනම් හේතු ප්‍රත්‍යව නිර්මාණය වූ බාහිර ලොව යථාර්ථවාදී නොවන හිස් වූවක් බව දැක්වීම යි. මෙය මායාවක්, සිහින නගරයක් හා සමාන බව ඔවුහු පෙන්වා දෙති.

මෙම සියලු අදහස්වලට ප්‍රතිවිරුද්ධ වූ ආකල්පයක් ඉදිරිපත් කරන්නා වූ යෝගාචාර විඥානවාදීහු බාහිර ලෝකය පිළිබඳව දක්වන්නේ විඥප්තිමාත්‍රතාව යි. බාහිර ලොව සියල්ල විඥානය තුළ නිර්මාණය වූවකි. විඥානය හැර කිසිවක් යථාර්ථ ලෙස විද්‍යමාන නොවේ. ඉන්ද්‍රිය ගෝචර වන්නා වූ විෂය වස්තූන් සිතින් මවා ගැනීමකි. පරිකල්පිතයකි. දෘෂ්‍යමාත්‍රතාවයකි. යනු විඥානවාදී මතය යි. මෙහි දී ථෙරවාද, සර්වාස්තිවාද සත්වාදී දර්ශනය සම්පූර්ණ වශයෙන් ප්‍රතික්ෂේප වන අතර සෞත්‍රාන්තික බාහ්‍යාර්ථ අනුමෙයවාදය සහ මාධ්‍යමික ශූන්‍යතාවාදය සංවර්ධනය කිරීමක් දක්නට ලැබේ.

''විඥප්තිමාත්‍රතා'' යන පදය පිළිබඳ විමසීමේ දී යෝගාචාරීහු මේ සඳහා ලබා දෙන්නා වූ අර්ථය වූයේ ''සිතින් මවා ගැනීමක්, වැටහීම් මාත්‍රයක්, චිත්ත නිර්මිත භ්‍රාන්තියක්'' යනුවෙනි. එසේ ම මෙහි භාෂාමය ව්‍යවහාරයන් සහ අර්ථකථනයන් පිළිබඳ විමසීමේ දී ''විඥප්තිමාත්‍රතා'' යන පදය යෝගාචාර දර්ශනය තුළ හැර භාෂාමය පාරිභාෂිත පදයක් ලෙස කිසිදු අවස්ථාවක හමු නොවේ. නමුත් ''විඥප්ති'' යන පදය පමණක් භාෂාව තුළ අර්ථ කිහිපයක් දැක්වීම සඳහා උපයෝගී කොටගෙන ඇත.

ශ්‍රී සුමඞ්ගල ශබ්දකෝෂය තුළ ''විඥප්ති'' යන පදයට අර්ථ දක්වා ඇත්තේ ''සැලකිරීම, දැක්වීම, හැඟවීම, අදහස් දක්වන කායික වාචසික ක්‍රියා''[15] යනුවෙනි. එසේ ම සිරිලියනගේ, නිරුක්ති සහිත සිංහල ශබ්දකෝෂය ''විඥප්ති'' පදයට ''හැඟවීම, සැලකිරීම, දැක්වීම, ප්‍රකාශ කිරීම'' යනුවෙන් අර්ථ

ඉදිරිපත් කොට ඇත.[16] අචාර්ය සෝමපාල ජයවර්ධනගේ සිංහල සමානාර්ථ ශබ්දකෝෂය තුළ ද මෙම පදය සඳහා ''දැන්වීම, සැලකිරීම, හැඟවීම''[17] යන අර්ථයන් ඉදිරිපත් කොට ඇත. මෙහි දී යෝගාචාර විඥප්තිමාත්‍රතා සංකල්පය තුළ දක්නට ලැබෙන ''මාත්‍රතා'' යන පදය පිළිබඳ විමසීමේ දී ඒ තුළින් අදහස් වන්නේ ''පමණකි'' යන අර්ථය බව සිතිය හැකි ය. මෙසේ විඥප්තිමාත්‍රතා පද විග්‍රහය තුළින් ''හැඟීමක් පමණි, සැලකිරීමක් පමණි, දැක්වීමක් පමණි'' යන අදහස් අර්ථවත් කළ හැක.

---

1 Hirakawa Akira, A History of Indian Buddhism from Sākyamuni to Early Mahahāyāí, Motilal Banarsidass, Delhi, p.117, Ff¸1993'

2 මේධානන්ද හිමි, දේවාලේගම, චතුර්විධ බෞද්ධ දර්ශන සම්ප්‍රදාය හැඳින්වීමක්, ආරිය ප්‍රකාශකයෝ, වරකාපොල, 1992.

3 **සර්‍වං සර්‍වදා අස්තීති සර්‍වාස්තිවාදඃ**
මේධානන්ද හිමි, දේවාලේගම, චතුර්විධ බෞද්ධ දර්ශන සම්ප්‍රදාය හැඳින්වීමක්, ආරිය ප්‍රකාශන, වරකාපොල, 1998, පි. 36

4 **ස්වභාව සාමාන්‍ය ලක්‍ෂණං ධාරෙතීති ධර්මාඃ**
මේධානන්ද හිමි, දේවාලේගම, චතුර්විධ බෞද්ධ දර්ශන සම්ප්‍රදාය හැඳින්වීමක්, ආරිය ප්‍රකාශන, වරකාපොල, 1998, පි. 37

5 **යෙ සූත්‍ර ප්‍රමාණිකා නතු ශාස්ත්‍ර ප්‍රමාණිකා තෙ සෞත්‍රාන්තිකාර්ථඃ**
නානායක්කාර, සනත්, මුල් බුදුදහමේ සිට වජ්‍රයානය දක්වා සරල හැඳින්වීමක්, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2003, පි. 76

6 **අනිච්චාවත සංඛාරා උප්පාද වය ධම්මිනො**
දී.නි., මහාපරිනිබ්බාණ සූත්‍රය, බු.ජ.මු, පි. 246

**උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති**
දී.නි., මහාපරිනිබ්බාණ සූත්‍රය, බු.ජ.මු, පි. 246

**සමුදය ධම්මානුපස්සි විහරති වය ධම්මානුපස්සි විහරති**
සං.නි., මහාවග්ග පාළි, සතිපට්ඨාන සූත්‍රය, බු.ජ.මු, පි. 210

7 **ක්‍ෂණිකානාං නාස්ති දෙශාන්තර ගමනං යත්‍රෛව උප්පත්ති තත්‍රෛව විනාශං**
නානයක්කාර, සනත්, මුල් බුදුදහමේ සිට වජ්‍රයානය දක්වා සරල හැඳින්වීමක්, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2003, පි. 65

8 සාසනරතන හිමි, මොරටුවේ, මාධ්‍යමික දර්ශනය විදුලකර ප්‍රඥාසාර ප්‍රශස්ති, සංස් බඹරැන්දේ සිරි සීවලී හිමි, 1996, පි.301

9 සාසනරතන හිමි, මොරටුවේ, මූලමාධ්‍යමික කාරිකාව 15-ංං ගාථාව, 1963,පි. 136

10 පඤ්ඤාසේන හිමි, ගාල්ලේ, ශූන්‍යවාදය, විදුලකර ප්‍රඥාසාර ප්‍රශස්ති, සංස් බඹරැන්දේ සිරි සීවලී හිමි, 1996, පි.309

11 මේධානන්ද හිමි, දේවාලේගම, චතුර්විධ බෞද්ධ දර්ශන සම්ප්‍රදාය, ආරිය ප්‍රකාශන, 1989, පි.84

12 Singh, Jaidev (1968) An Introduction to Madyamaka Philosophy, Motilal bansidass, p.23

13 **යං ප්‍රතීත්‍ය සමුප්පාදඃ - ශූන්‍යතාඃ ප්‍රචක්ෂ්මහෙ**

**සා ප්‍රඥප්ති රූපාදාය - ප්‍රතිපති සෙව මධ්‍යමා**

ශාසනරතන හිමි, මොරටුවේ, මූඃමාඃකාඃ 24- 18 , පි.160 ගාථාව, පී ජේ රුදිගො ප්‍රකාශන, 1963

14 **අප්‍රතීත්‍ය සමුප්පන්නෝ - ධර්මඃ කශ්චින්න විද්‍යතේ**

**යස්මාත් තස්මාද් ශූන්‍යොභි - ධර්මඃ කශ්චින්න විද්‍යතෙ**

ශාසනරතන හිමි, මොරටුවේ, මූඃමාඃකාඃ 24- ංසං ගාථාව, පී ජේ රුදිගො ප්‍රකාශන, 1963

15 සෝරත හිමි, වැලිවිටියේ, ශ්‍රී සුමඞගල ශබ්ද කෝෂය, ද්විතීය භාගය, චතුර මුද්‍රණය, වැල්ලම්පිටිය, 1999,

16 ලියනගේ, සිරි, නිරුක්ති සහිත සිංහල ශබ්ද කෝෂය, ඇස්. ගොඩගේ, කොළඹ, පි. 994

17 ජයවර්ධන, සෝමපාල, සිංහල සමානාර්ථ ශබදකෝෂය, ඇස් ගොඩගේ, කොළඹ, 1994, පි. 123